2025.04.18

**ප්‍රධාන කර්තෘ / ප්‍රවෘත්ති කර්තෘ**
**අධ්‍යක්ෂ (ප්‍රවෘත්ති) / ප්‍රවෘත්ති කළමනාකරු**
**වෙබ් අඩවි කර්තෘ**

**" සිරි දළදා වන්දනාව"**
**ව්‍යාජ ලෙස සකස් කරන ලද ආරාධනා පත්‍රයක් සමාජ මාධ්‍ය ඔස්සේ සංසරණය වීම**

සිරි දළදා වන්දනාවට අදාළව විශේෂ ආරාධිත අමුත්තන් වෙත නිකුත් කර ඇතැයි හැඟෙන පරිදි ව්‍යාජ ලෙස නිර්මාණය කරන ලද ආරාධනා පත්‍රයක ආකෘතියක් සමාජ මාධ්‍ය ඔස්සේ සංසරණය වන බව නිරීක්ෂණය කරමි.

මෙබඳු ආරාධනා පත්‍රයක් රජය විසින් නිකුත් කර නොමැති බව කාරුණිකව සඳහන් කරමි.

උතුම් සිරි දළදා වන්දනාවේ පූජනීයත්වය සුරකෙන පරිදි කටයුතු කරන මෙන් සියලු පාර්ශවයන්ගෙන් ඉතා ගෞරවයෙන් යුතුව ඉල්ලා සිටිමි.

**එච්.එස්.කේ.ජේ.බණ්ඩාර**
**රජයේ ප්‍රවෘත්ති අධ්‍යක්ෂ ජනරාල්**
**රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව**

**දුරකථන අංකය :-** 0112-513638
**ෆැක්ස් :-** 0112 -514753
**විද්‍යුත් ලිපිනය :-** dg@dgi.gov.lk

FAKE

මහාවිහාරවංශික ස්‍යාමෝපාලි මහානිකායේ

මල්වතු සහ අස්ගිරි උභය පාර්ශවීය අතිපූජනීය

මහානායක මාහිමිපාණන්වහන්සේලාගේ අනුශාසකත්වයෙන්

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ

# ගරු ජනාධිපති අනුර කුමාර දිසානායක

මැතිතුමාගේ ආරාධනයෙන්

සම්මා සම්බුද්ධරජාණන්වහන්සේගේ

සිරි දන්ත ධාතූන් වහන්සේ දැක, වැඳ පුදාගැනීමේ

සමාරම්භක පූණ්‍යවන්ත අවස්ථාව

**ශ්‍රී බුද්ධ වර්ෂ 2568 ක් වන බක්මස (18) වන දින**

**පෙ. ව 11.45 ට** ඓතිහාසික මහනුවර

ශ්‍රී දළදා මාලිගාවේදී පැවැත්වෙන

මෙම උතුම් අවස්ථාවට සහභාගීවන ලෙස

ඔබතුමාට/ ඔබතුමියට ගෞරව පූර්වකව ආරාධනා කරමි.

ආචාර්ය නන්දික සනත් කුමානායක
ජනාධිපති ලේකම්

(මෙම ආරාධනා පත්‍රය රැගෙන පෙරවරු 11.30ට පෙර මහනුවර ජනාධිපති මන්දිරයට
පැමිණෙන ලෙස කාරුණිකව ඉල්ලා සිටිමි.)

FAKE